# New Director General, SACEP

Environment Minister Anura Priyadarshana Yapa as chairman, Governing Council of the South Asia Cooperative Environment Programme (SACEP) appointed S M D P Anura Jayatilake as the new Director General of SACEP with effect from May 2012 for three years.

Anura Jayatilake, nominated at the 12th Meeting of the Governing Council of SACEP, is the 10th Director General of SACEP. Prior to this assignment, he served as a Director at the Environment Ministry. He has over two decades experience in environmental management, policy making and implementation at national and international levels. He was instrumental in the implementation of the Vehicle Emission Test programme in Sri Lanka with the coordination of relevant stakeholders.

Daily News.

28.06.2012

Bw-04

(2)

Lakbima News Paper - Page 15; 29 June 2012

# දකුණු ආසියා පාරිසරික සහයෝගිතා වැඩසටහනෙහි අධ්‍යක්ෂ ජනරාල් පදවියට අනුර පියතිලක

❑ *අචලා ධර්මසේන*

**දකුණු** ආසියාතික පාරිසරික සහයෝගිතා වැඩසටහනේ (SACEP) පාලක කවුන්සිලයේ සභාපති ලෙස කටයුතු කරන පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතා එම වැඩසටහනෙහි නව අධ්‍යක්ෂ ජනරාල් ලෙස අනුර ජයතිලක මහතා වසර තුනක කාලයක් සඳහා පත් කළේය.

දකුණු ආසියාතික පාරිසරික සහයෝගිතා වැඩසටහනෙහි පාලක කවුන්සිලයේ 12 වන සමුළුවේදී ගනු ලැබූ තීරණයක් ලෙස, ශ්‍රී ලංකා රජය විසින් එම වැඩසටහනෙහි අධ්‍යක්ෂ ජනරාල් ලෙසට අනුර ජයතිලක මහතා සුදුසු යැයි යෝජනා කරන ලදී.

මෙම පත්කිරීම සිදු කිරීමට පෙර අනුර ජයතිලක මහතා මෙරට පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළේය. මෙයට පෙර පරිසර අමාත්‍යාංශයේ විවිධ අංශවල මෙන්ම මධ්‍යම පරිසර අධිකාරියේ ද සේවය කර ඇති ඒ මහතා නව පරිසර කළමනාකරණය, ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජාතික හා ජාත්‍යන්තර තලයේ දශක දෙකක පමණ අත්දැකීම් ද ඇත.

ලක්බිම

2012.06.29.

පිටුව - 15

Mawbima News Paper - Page 5; 29 June 2012

# දකුණු ආසියා පරිසර මුල් පුටුවට වසර 27කට පසු ලාංකිකයෙක්



*පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතා සහ එක්සත් ජාතීන්ගේ දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහනේ අධ්‍යක්ෂ ජනරාල් එස්.එම්.ඩී.පී.ඒ. ජයතිලක මහතාට සුබ පතයි.*

තක්ෂාලා ශ්‍රීමාලි බණ්ඩාර

එක්සත් ජාතීන්ගේ දකුණු ආසියා පාරිසරික සහයෝගිතා වැඩසටහනේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර වසර 27කට පසු ශ්‍රී ලාංකිකයෙකුට හිමි වේ.

නව අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් වූයේ එස්.එම්.ඩී.පී.ඒ. ජයතිලක මහතාය. ශ්‍රී ලංකා පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කළ මේ මහතා පරිසර කළමනාකරණය, ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජාතික හා ජාත්‍යන්තර තලයේ දශක දෙකක පමණ අත්දැකීම් ලබා තිබේ.

දකුණු ආසියාතික පාරිසරික සහයෝගිතා වැඩසටහනේ පාලන කවුන්සිලයේ සභාපති පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් "SACEP" හි පාලන කවුන්සිලයේ 12 වන සමුළුවේදී කරන ලද යෝජනාවකට අනුව මේ නව තනතුර අප රටට හිමි වී ඇත.

2012.06.29

(4)

Dinamina News Paper - Page 7; 29 June 2012

# එක්සත් ජාතින්ගේ දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා නව අධ්‍යක්ෂ අනුර ජයතිලක

**ශීලා උඩුවර**



පරිසර ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මහතා නව අධ්‍යක්ෂ ජනරාල් අනුර ජයතිලක මහතාට සුබපතයි.

එක්සත් ජාතීක්ගේ දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා නව අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකුවන අනුර ජයතිලක මහතා පත්ව සිටී.

දකුණු ආසියාතික පාරිසරික සහයෝගිතා වැඩසටහනේ පාලන කවුන්සලයේ සභාපති ලෙස කටයුතු කරන පරිසර ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් මෙම පත්වීම සිදුකරන ලදී.

ශ්‍රී ලංකාව මෙම තනතුරට පත්වූයේ වසර 27 කට පසුවය.1982 වසරේදී පිහිටුවනු ලැබූ මෙම අන්තර් රාජ්‍ය සංවිධානයේ මූලිකත්වය ඉසිලීමට ශ්‍රී ලංකාවට ලැබෙන දෙවන අවස්ථාව මෙයයි. ජයතිලක මහතා වසර 3ක කාලයක් මෙම තනතුර දරනු ලැබේ.

මෙම රාජ්‍ය සංවිධානයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා වූයේ ආචාර්ය ලෙස්ලි හේරත් මහතා වන අතර,ඉන්පසුව ශ්‍රී ලංකාවට මෙම තනතුර හිමිවූයේ මෙවරය.දකුණු ආසියාතික පාරිසරික සහයෝගිතා වැඩ සටහනේ පාලන කවුන්සලයේ 12 වැනි සමුළුවේදී ගනු ලබන තීරණයක්ලෙස ශ්‍රී ලංකා රජය විසින් අනුර ජයතිලක මහතා යෝජනා කර තිබේ. පරිසර අමාත්‍යාංශයේවිවිධ අංශවල මෙන්ම මධ්‍යම පරිසර අධිකාරියේද සේවය කර ඇති ජයතිලක මහතා පරිසර කළමණාකරණය,

ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාත්‍යන්තර හා ජාතික තලයේ දශක ‍දකක පමණ අත්දැකීම් ඇත්තෙකි.

පාරිසරික කටයුතු සහ ජාත්‍යන්තර කතිකාවත් සම්බන්ධව විද්‍යාත්මක දැනුම මෙන්ම පුළුල් අවබෝධයක්ද ඔහුට ඇත.

දිනමිණ

2012.06.29.

# SACEP නව අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ලාංකිකයෙක්

2012 ජුනි 28 වෙනි බ්‍රහස්පතින්දා, 07:37

වසර 27 කින් අනතුරුව එක්සත් ජාතීන්ගේ දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහනේ (SACEP) නව අධ්‍යක්ෂ ජනරාල් තනතුරට එස්එම්ඩීපිජී ජයතිලක වසර තුනක් සඳහා පත් කෙරේ.

ශ්‍රී ලංකා පරිසර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ හෙතෙම SACEP පාලන කවුන්සලයේ 12 වැනි සමුළුවේ දී එළඹි තීරණයකට අනුව 2012 මැයි 12 වැනි දා සිට බල පැවැත්වෙන පරිදි අදාල තනතුරට අනුයුක්ත කර ඇත.

මොරටුව සරසවියෙන් පාරිසරික ඉදිකිරීම පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද,එයින් ම වාස්තු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ද,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ද,කොළඹ විශ්වවිද්‍යාලයෙන් පිරිනමන පරිසර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද හිමි නව අධ්‍යක්ෂ ජනරාල්වරයා වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ධුරය හොබවයි.

← සරසවි කටයුතු ඔක්තෝබර් 20 අරඹනවා - මහාචාර්ය ගාමිණී සමරනායක

ප්‍රතිසමීක්ෂණයෙන් අයදුම්කරුවන් 2725 දෙනෙකුට ඉහළ ප්‍රතිඵල - විභාග කොමසාරිස් →

Share / Save




## බදුල්ලේ සිසුන් පිරිසක් රෝහල්ගත කෙරේ
28/06/2012



බදුල්ල, හාලිඇල ශාන්ත ජේම්ස් වත්ත විදුහලේ සිසුන් 132 දෙනෙකු ආහාර විෂවීමක් හේතුවෙන් හදිසියේ රෝහල්ගත කර ඇති බව වැඩ බලන පොලිස් මාධ්‍ය ප්‍රකාශක සජීව මැදවත්ත පවසයි.

## ලුනාව ජනසෙවණ මහල් නිවාස ඉදිකිරීම ඇරඹේ
28/06/2012

මොරටුව, ලුනාව ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය සඳහා ඉදිකෙරෙන නිවාස 356කින් යුත් ලුනාව ජනසෙවණ මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 28වැනිදා ලුනාව පැරණි තානායම් ඉඩමේදී ආරම්භ කෙරිණි.

## ජ'පුර සරසවියේ අධ්‍යයන කටයුතු ඇරඹේ
28/06/2012



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලු පීඨවල දේශන 28වැනිදා සිට නැවත ආරම්භ වූ බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පවසයි.

## බොරගැස්ගමුවේ වතුර වලක දිය වී යන මළ සිරුරක්
28/06/2012

බොරලැස්ගමුව ප්‍රදේශයේ හිස් භූමි භාගයක වූ ජලය පිරි විශාල වලක තිබී හඳුනාගත නොහැකි ලෙස කොටස් කුණු වී ගිය මළ සිරුරක් පොලිසිය සොයා ගනී.

ASIAN MIRROR

කතුහිමිකම © 2012 ඒසියන් මිරර් සමාගම සතුය. සියළු හිමිකම් ඇවිරිනි. .
කතු හිමිකම් අයිතිය සුරක්ෂිය. මෙම වෙබ් අඩවියේ අඩංගු සියළුම තොරතුරු වල අයිතිය හිමිකම ඒෂියන් මිරර් සමාගම සතු අතර උපුටා ගත හැක්කේ අනුග්‍රහය www.asianmirror.lk වෙත යොමු කිරීමෙන් පමණකි.